“නියත වශයෙන්ම ෂෙයිතාන් අරාබි අර්ධද්වීපයේ සලාත් ඉටු කරන්නන් තමාට ගැතිකම් කිරීම පිළිබඳව බලාපොරොත්තු සුන් කර ගත්තේය. නමුත් ඔවුන් අතර අර්බුද පතුරුවාලීමෙහි ඔහු උපේක්ෂාවෙන් සිටියි

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කළ ප්රකාශයකට මම සවන් දී ඇත්තෙමි යැයි පවසා ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “නියත වශයෙන්ම
ෂෙයිතාන් අරාබි අර්ධද්වීපයේ සලාත් ඉටු කරන්නන් තමාට ගැතිකම් කිරීම පිළිබඳව බලාපොරොත්තු සුන් කර ගත්තේය. නමුත් ඔවුන් අතර අර්බුද පතුරුවාලීමෙහි ඔහු උපේක්ෂාවෙන් සිටියි."
[صحيح] [رواه مسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ දැන්වා සිටියහ. "නියත වශයෙන්ම ඉබ්ලීස් අරාබි අර්ධත්වීපයේ සලාත් ඉටු කරන මුඃමින්වරුන් තමන්හට ගැතිකම් කිරීම හා පිළිමවලට වන්දනාමාන කිරීම සඳහා නැවත යොමු කර ගැනීම සම්බන්ධයෙන් බලාපොරොත්තු සුන් කර ගත්තේය. නමුත් ඔවුන් අතර තර්ක විතර්ක, කේරා්ධය, සතුරුකම, අර්බුධ යනාදිය පතුරුවාලීම සඳහා ඔහු වෙහෙසෙමින්, උපාය මාර්ග යොදමින් කටයුතු කරමින් සිටියි. ඒ ගැන ආශාවෙන් සිටියි."

http://sunnah.global/hadeeth/si/show/8886